# සන්නිවේදන

ශාස්ත්‍රීය සංග්‍රහය

2001/ අංක 1


**25** සැමරුම

ජනසන්නිවේදන
අධ්‍යයන අංශය

# සන්නිවේදන

## ශාස්ත්‍රීය සංග්‍රහය

2001 / අංක 1



## ලිපි


- **සාම්ප්‍රදායික සමාජය හා සන්නිවේදනය**
  ආචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස — 1
- **සංස්කෘතිය හා සන්නිවේදනය (මානව විද්‍යා ප්‍රවේශයෙන් යුත් සටහනක්)**
  මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර — 7
- **ඩේවිඩ් කේ. බර්ලෝ සන්නිවේදන ආකෘතිය පිළිබඳ විග්‍රහයක්**
  ආචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ — 13
- **සන්නිවේදනයේ අන්තර්ගත දොරටුපාල සංකල්පය**
  රමණී කුලසේකර — 18
- **වෙළඳ දැන්වීම් කෙරෙහි ඇතිවන පාරිභෝගික ආකර්ශනය පිළිබඳ විමර්ශනයක්**
  ආශිර්දිනී භාග්‍යා අත්තනායක — 24
- **ශ්‍රී ලංකාවේ වීඩියෝ චිත්‍රපට හා සමාජ සම්බන්ධතා**
  සුගත් මහින්ද සෙනරත් — 41
- **ජනප්‍රිය සංස්කෘතිය හා සන්නිවේදනය**
  සේනක සෙනවිරත්න — 53
- **ජනමාධ්‍යවේදය හා සංස්කෘතික අධ්‍යයනයේ ක්‍රමවේදී ගැටළු**
  ආචාර්ය ටියුඩර් වීරසිංහ — 62
- **කඩදාසියේ සිට පොත් භාවිතය දක්වා ඓතිහාසික විමසුම**
  අජන්තා හපුආරච්චි — 71
- **සාම්ප්‍රදායික තහංචි සංකල්පය සහ නවීන සන්නිවේදනාර්ථ**
  අරුණ ලොකුලියන — 80
- **විශ්ව වාර ප්‍රකාශයන්හි ප්‍රභවය සහ විකාශනය**
  විජයානන්ද රූපසිංහ — 88
- **දෘශ්‍ය මාධ්‍ය විචාර ප්‍රවණතා නව පර්යේෂණ විධික්‍රම විමසුම**
  ආචාර්ය ආරියරත්න ඇතුගල — 95



**සංස්කාරක මණ්ඩලය**

විධායක සංස්කාරක :
මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර

ප්‍රධාන සංස්කාරකවරු :
ආචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ
ආචාර්ය ආරියරත්න ඇතුගල

සහාය සංස්කාරක :
විජයානන්ද රූපසිංහ

කර්තෘ මණ්ඩල සම්බන්ධීකරණය :
ආශිර්දිනී භාග්‍යා අත්තනායක


සඟරා සැලසුම :
අරුණ ලොකුලියන
විජයානන්ද රූපසිංහ



**ජනසන්නිවේදන අධ්‍යයන අංශය**
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය.
✆ 917713

**ISSN 1391-6777**

**ගොඩගේ ප්‍රකාශනයකි.**



# ශ්‍රී ලංකාවේ වීඩියෝ චිත්‍රපට හා සමාජ සම්බන්ධතා

සුගත් මහින්ද සෙනරත්

**හැඳින්වීම.**

1977 වසරේ දී විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැගීමත් සමඟ සන්නිවේදන ක්ෂේත්‍රයේ විශාල වෙනසක් ඇතිවිය. එහිදී ශ්‍රී ලංකාවට රූපවාහිනී මාධ්‍යය හඳුන්වාදෙනු ලැබින. ඒ අනුව 1979 වසරේදී ස්වාධීන රූපවාහිනී සේවයත්, 1982 වසරේදී ජාතික රූපවාහිනී සංස්ථාවත් බිහිවිය.

රූපවාහිනිය ශ්‍රී ලංකාව ඇදබැඳ තබාගැනීමට සමත්වූ මාධ්‍යයක් බවට පත්විය. විශේෂයෙන්ම වෙනත් වැඩසටහන් අතර වෘත්තාන්ත චිත්‍රපට ප්‍රදර්ශනය කිරීම ඇරඹීමත් සමඟ සිනමා ශාලා කරා ඇදීගිය ප්‍රේක්ෂකයන්ද විශාල ප්‍රමාණයක් ඇද ගැනීමට රූපවාහිනිය සමත්විය.

"1979 දී 2810 කින් මෙරට ඇරඹි රූපවාහිනී යන්ත්‍ර ගණන 1980 දී 40335 ක් දක්වාත්, 1981 දී 53,977 දක්වාත් වර්ධනය විය. ඒ වනවිටද මෙරට රූපවාහිනී විකාශනය දීප ව්‍යාප්ත නොවිණ. එහෙත් 1982 දී ජාතික රූපවාහිනිය ඇරඹීමත් සමඟ රූපවාහිනී යන්ත්‍ර 1,28,677 ක සංඛ්‍යාවක් මෙරට තුළ අලෙවි වූයේය. දළ වශයෙන් තුන් දෙනෙක් එක් රූපවාහිනී යන්ත්‍රයක් නරඹන්නේයයි නිගමනය කළහොත්, දිනකට රූපවාහිනී යන්ත්‍ර නරඹන 386031 ක් සිනමාවට අහිමිවී ඇත. 1979 දිනකට 112,519 ක් චිත්‍රපට නැරඹූහ. ඒ සංඛ්‍යාව 1980 දී 105,322 ක් ද 1981 දී 80012, 1982 දී 68,152 දක්වා අඩු විය.

වර්තමානය වනවිට රජයේ මෙන්ම පෞද්ගලික නාලිකාවන්ද විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක වන අතර ඒවායේ චිත්‍රපට විශාල ප්‍රමාණයක් නිරන්තරයෙන් විසුරුවා හැරේ.

රූපවාහිනියේ ආගමනයෙන් පසුව ජනතාවට චිත්‍රපට නැරඹීමේ තවත් පහසු මාර්ගයක් ඇතිවිය. ඒ වීඩියෝ කැසට් ධාවන යන්ත්‍ර පැමිණීමය. විදේශ රැකියා වෙළඳපළ පුළුල් වූ අතර විදේශ රැකියාවකට ගොස් ආපසු පැමිණෙන්නේ බොහෝවිට රූපවාහිනී යන්ත්‍රයට අමතරව වීඩියෝපට හා වීඩියෝ කැසට් ධාවන යන්ත්‍ර රැගෙන ආවෝය.

විදේශයන්ට ගොස් පැමිණි ශ්‍රී ලාංකිකයන්.

| වර්ෂය | සංඛ්‍යාව | වර්ෂය | සංඛ්‍යාව |
|---|---|---|---|
| 1983 | 180729 | 1987 | 217127 |
| 1984 | 227389 | 1988 | 245065 |
| 1985 | 220094 | 1991 | 225016 |
| 1986 | 220614 | 1992 | 339107 |

*(2)

මීට අමතරව දේශීය වෙළඳපළේද වීඩියෝ කැසට් ධාවන යන්ත්‍ර අළෙවි වූ අතර ඒවායේ මිළගණන් ක්‍රමයෙන් පහළ බසින්නට වීමත් සමඟ සමාජයේ ව්‍යාප්ත වෙමින් පවතී.

මේ අතර වීඩියෝ කැසට් (VHS) පට කුලියට ලබාදෙන ශාලා ද විශාල වශයෙන් ව්‍යාප්ත විය. මේවා දිවයිනේ සෑම ප්‍රදේශයකම

දැකගත හැකිය. වීඩියෝ කැසට්පට කුලියට හා අලෙවිය සඳහා තබා ඇති ශාලාවන්ට අමතරව වීඩියෝ ප්‍රදර්ශන ශාලාද බිහිවිය. මේවායේ ව්‍යාප්තිය කොතෙක්ද යත් සිනමාශාලාවන් සමීපයේ නිවෙස්වල පවා මුදලට විවිධ කැසට්පට ප්‍රදර්ශනය කිරීම සිදුවිය.

එපමණක් නොව පවුලේ අය හෝ මිතුරන් සමඟ වීඩියෝ කැසටයක් නැරඹීමද නගරාශ්‍රිතව ජනප්‍රිය විය. තාක්ෂණයේ දියුණුවත් සමඟ වීඩියෝ සංගත තැටි (Video Compact Disc - Players) ධාවන යන්ත්‍ර වෙළඳපළට පැමිණින. ඒ අතරතුර එම තාක්ෂණයේම තවත් දිගුවක් වශයෙන් සංඛ්‍යාංක සංගත තැටි (Digital Compact Disc Players) ධාවන යන්ත්‍ර හා තැටි වෙළඳපළට එක්විය.

ඩීවීඩී ධාවන යන්ත්‍ර 1999 වන විට අලෙවි කිරීමේ ගැටළුවකට මුහුණපා තිබුණත් පසුව ධාවන යන්ත්‍ර හා තැටිවල මිල පහත වැටීමත් සමඟ 2000 වනවිට මේ තත්ත්වය වෙනස්වී ඇති බව ඒෂියාවීක් සඳහන් කරයි. වැඩිදුරටත් සඳහන් කරන පරිදි 2000 වසරේදී ඩීවීඩී (DVD) යන්ත්‍ර මිලියන 46 ක් අළෙවි වී තිබේ. එය 1999 ට වඩා 300% ක වැඩිවීමකි. ඉදිරි වසර පහක කාලය තුළ ඩීවීඩී (DVD) යන්ත්‍ර ලොවපුරා සම්පූර්ණයෙන්ම පැතිරී යනු ඇති බව එහි අදහසයි. (3)

පරිගණකය භාවිතයෙන් චිත්‍රපට නැරඹීමත්, අන්තර් ජාලය ඔස්සේ චිත්‍රපට ලබාගැනීමත් මේ වන විට ජනප්‍රියවෙමින් පවතී.

රූපවාහිනියෙන් චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමත් වීඩියෝ චිත්‍රපට භාවිතයත් ශ්‍රී ලංකාවේ කොතෙක් ප්‍රබල ප්‍රශ්න මතුකොට ඇත්දැයි යන්න ඒ පිළිබඳව වන විවිධ සංවාදයන්ගෙන් හා මතවාදයන්ගෙන් වඩාත් පැහැදිලි වේ.

1999 ජූනි 18 වන දින මරදානේ එල්පින්ස්ටන් රඟහලේ පැවති ඕ.සී.අයි.සී. උත්තමාචාර රජත ජයන්ති සිනමා උළෙලේදී "මී ලඟ සියවසේ සිනමාව" නමින් තිස්ස අබේසේකර මහතා ප්‍රධාන දේශනය පවත්වන ලදි. එහිදී ඔහුගේ කතාවෙන් මතුකළ කරුණු කිහිපයක් මෙහිලා උපුටා දක්වමි.(4)

"ශ්‍රී ලාංකීය සිනමා අර්බුදය විසඳීම සඳහා උනන්දුවක් දක්වන සිනමා ශිල්පීන්, විද්‍යාර්ථීන්, විචාරකයින් හා පරිපාලකයන් යන සියලුම කොටස්වල අවධානයට ලක්විය යුතු මේ මාහැඟි කතිකාවතේ මුල්ම ලිපියවන සිනමාවේ අනාගතයත්, සුසංයෝග ප්‍රයෝග හා ප්‍රභේද යනමැයෙන් තෝමස් අල්සායෙසර් විසින් ඉදිරිපත් කෙරෙන ලිපියෙන් කෙටි ඡේදයක් මෙහිදී ඉදිරිපත් කිරීම සුදුසු යයි සිතමි.

සිනමාකරුවන් පුංචි තිරය අවඥාවෙන් බැහැර කළ කාලය යුරෝපයේ කෙළවර වූයේ 1980 දශකයේ මුල් වසර වලදීය. රූපවාහිනී ආයතනයන්හි මූල්‍ය ආයෝජනයෙන් තොරව එකදු වෘත්තාන්ත චිත්‍රපටයක්වත් පසුගිය සියවස තුළ නිපදවී නැත. එක්සත් ජනපදයේ චිත්‍රපට ආදායමෙන් 60% ලැබෙනුයේ රූපවාහිනියෙන් කේබල් නාලිකා ජාලයෙන් හා චිත්‍රපටවල (VHS) පිටපත් අලෙවියෙන් බව ගණන් බලා තිබේ. තවද බොහෝ රූපවාහිනී නාලිකාවන් සිය ප්‍රදර්ශන කාලයෙන් විශාල කොටසක් වෙන්කරනුයේ චිත්‍රපටකරුවන්ගෙන් හෝ හොයිවුඩ් සමාගම්වලින් මිලදී ගත් පැරණි චිත්‍රපට ප්‍රදර්ශනය සඳහාය. සිනමාහල්වල ප්‍රදර්ශනයකිරීම අසාර්ථකවූ බොහෝ චිත්‍රපට දැන් සිය නිෂ්පාදන වැය පියවාගනු ලබන්නේ එම චිත්‍රපටය රූපවාහිනී නාලිකාවන්ට විකිණීමෙන් හෝ එහි පිටපත් අලෙවියෙනි,

එසේම තිස්ස අබේසේකර මෙසේද සඳහන් කරයි.

"............... එපමණක් නොවේ. අපට හැඟීගොස් ඇති පරිදි සිනමා රසවින්දනය කෙරෙහි වඩාත්ම බලපා ඇත්තේ කැසට් ධාවන යන්ත්‍ර මගින් ප්‍රබුද්ධ රසික පිරිස් නිතර නරඹන දුර්ලභ ගණයේ චිත්‍රපටවල (VHS) පිටපත් ය.

වීඩියෝ තාක්ෂණය අශ්ලීල චිත්‍රපට නැරඹීමට රුකුලක් ඇති වී ඇතුවා සේම ප්‍රබුද්ධ සිනමා රසිකයන්ට සිනමාව සාහිත්‍යය හා සංගීතය සේම පුද්ගලික වූ සහානුභූතියක් බවට පත්කොට ඇත." *(4)

එසේම වීඩියෝ ක්ෂේත්‍රයේ පවතින තත්ත්වයන් පිළිබඳව 1997 වසරේදී මහාචාර්ය සේනක බණ්ඩාරනායක ගේ සභාපතිත්වයෙන් පත් කළ "ශ්‍රී ලංකාවේ චිත්‍රපට කර්මාන්තයේ පුනරුත්ථාපනය හා සංවර්ධනය පිළිබඳව ජනාධිපති කමිටු වාර්තාවේ අදාල උද්‍ධෘතයන් කිහිපයක් මතු උපුටා දක්වමි.

**වීඩියෝ ශාලා**

වීඩියෝ ශාලා හා පොදු වීඩියෝ පුස්තකාලවලට බලපත්‍ර නිකුත් කිරීම අත්‍යවශ්‍ය බවත්, රූගත පාලක මණ්ඩල පනත දැන් ක්‍රියාත්මක කරන ආකාරය, වීඩියෝ මාධ්‍යයට අදාලව ක්‍රියාත්මක කිරීමට ඇතිකරවිය හැකි නමුත් රූගත පාලක පනතේ සිනමාවට අදාලව ඇති රෙගුලාසි වීඩියෝ ශාලාවලට ද බලපෑයුතු බවක් අපගේ හැඟීමයි. වීඩියෝ ශාලා විසින් බදු හා ගාස්තු ගෙවීමට අදාලව මේ හා සමගම ප්‍රශ්න පවතී. වීඩියෝ ශාලා පිළිබඳව ප්‍රශ්නය, ජාතික ප්‍රතිපත්තියක් හා උපදෙස් මාලා සපයන රෙගුලාසි සංග්‍රහයක් තුළින් මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් හොඳින් කටයුතු කිරීමට හැකි පළාත් පාලන බලධාරීන්ට නීතිමය බලතල ලබාදීම තුළින් විසඳා ගතයුතු වෙයි.

වීඩියෝ ශාලා සංඛ්‍යාව වැඩිවීම, ජනප්‍රිය විනෝදාස්වාදන මාධ්‍යයක් ලෙස සංවර්ධනය වී පුළුල් වීමට සිනමාව අපොහොසත් වීම පෙන්වන දර්ශනයකි. අසභ්‍ය චිත්‍රපට පෙන්වන රහසිගත මාධ්‍යයක් වශයෙන් එය නිශ්චිත ප්‍රේක්ෂක සංඛ්‍යාවකට සීමාවී ඇති අතර එහි පැවැත්ම හා ප්‍රගුණනය විශේෂයෙන් පාසල් ශිෂ්‍යයන් හා තරුණයන් කෙරෙහි බරපතල සමාජ හා සංස්කෘතික බලපෑම් ඇතිකරවිය හැකිය. කෙසේ වුවත්, මෙවැනි ප්‍රශ්න සම්බන්ධව අදාල සමාජසේවා හා නීති ක්‍රියාත්මක කරන බලධාරීන් විසින් කටයුතු කළ අතර ඒවා ජාතික චිත්‍රපට සංස්ථාව වැනි ආයතනයක විෂය පථයට සම්පූර්ණයෙන් පරිබාහිර වේ. කෙසේ වුවත් සිනමාවට පුනර්ජීවයක් දීම හා නිවෙස්වල ඇති වීඩියෝ යන්ත්‍ර ප්‍රගුණනය නිසැකවම වීඩියෝ ශාලා වර්ධනය වීම සීමාකරනු ඇත.

**හිමිකම් පැනවීම**

සිනමා කර්මාන්තයට විශේෂයෙන් රූපවාහිනිය සහ වීඩියෝවේ ප්‍රගුණනය නිසා මුහුනපෑමට ඇති හා අනාගතයේදී ද වැඩි වශයෙන් මුහුණපෑමට සිදුවන බරපතල ප්‍රශ්නයක් වනුයේ හිමිකම් පිළිබඳ ප්‍රශ්නයයි. වඩා ශක්තිමත් බලපත්‍ර සීමාවන් පැනවීම සඳහා ව්‍යවස්ථා හඳුන්වාදීම තුළින්, හිමිකම් සුරැකීම වඩා හොඳින් අධීක්ෂණය හා ඇතැම්විට ක්‍රියාත්මක කිරීමට වන බව සහතික විය හැකිය. දැනට බුද්ධිමය දේපල පනත් සංග්‍රහයක් (1979) හිමිකම් පිළිබඳ නිර්වචනය කිරීමක් හා පැහැදිලි කිරීමක් පමණක් අන්තර්ගත වන අතර ක්‍රියාත්මක කිරීම මුලුමනින්ම පුද්ගලික නඩු පැවරීම මත පමණක් සිදුවේ. වීඩියෝ ශාලා හා වීඩියෝ පුස්තකාලවලට බලපත්‍ර නිකුත් කිරීමේදී හිමිකම් නිති පිළිපැද ඇති බවට ආචාර ධර්මානුකූල ප්‍රකාශයක් කළ යුතු බවත්, උල්ලංඝනය කරන අවස්ථාවන්හිදී පැහැදිලි හා ආර්ථික වශයෙන් ඵලදායී දඬුවම් නියම කළ යුතු බවත් කමිටුවේ නිර්දේශයයි., *(5)

වීඩියෝ මාධ්‍ය ශ්‍රී ලංකාවට හඳුන්වාදී දසක කිහිපයක් ගතවී තිබුණද ඒ පිළිබඳව මේ වනතෙක් නිසි අධ්‍යයනයක් සිදු කොට නොමැත. බොහෝ පිරිස් සිය අදහස් මතවාදයන් ඉදිරිපත් කරනුයේ විද්‍යාත්මක නියරක පිහිටා නොවේ. ශීඝ්‍රයෙන් මාධ්‍ය සංවර්ධනය වන මෙවන් යුගයක වීඩියෝ මාධ්‍ය හා එමගින් සමාජයට සිදුව ඇති, සිදුකරනු ලබන බලපෑම් පිළිබඳව විද්‍යාත්මක අධ්‍යයනයක් සිදුකිරීම අවශ්‍යව ඇත.

**පර්යේෂණ ක්‍රමවේදය**

1. වීඩියෝ චිත්‍රපට නරඹන පුද්ගලයන් අතරින් අහඹු ක්‍රමයට තෝරාගත් 200 ක පමණ

නියදියකින් ප්‍රශ්නාවලියක් ඇසුරින් දත්ත රැස්කරගන්නා ලදි. කොළඹ, කුරුණෑගල, ගම්පහ, කෑගල්ල, කලුතර, මොණරාගල, බදුල්ල, ගාල්ල, මාතර, හම්බන්තොට, පුත්තලම, අනුරාධපුර, පොළොන්නරුව, මහනුවර, නුවරඑළිය යන දිස්ත්‍රික්කයන්ගෙන් එම නියදිය තෝරා ගන්නා ලදි.

2. පූර්වෝක්ත දිස්ත්‍රික්කවල පිහිටි වීඩියෝ ශාලා අහඹුලෙස තෝරාගැනීමෙන් පසු ඒවා පවත්වාගෙන යන්නන් සමඟ සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් දත්ත රැස්කරගන්නා ලදි. දත්ත රැස්කරගැනීමේ කටයුතු කැලණිය විශ්වවිද්‍යාලයේ ජන සන්නිවේදන විශේෂවේදී උපාධි හදාරන විද්‍යාර්ථීන් විසින් සිදුකරන ලදි.

3. වීඩියෝ චිත්‍රපට පරිශීලනය පිළිබඳව ලිඛිත මූලාශ්‍ර අධ්‍යයනය කොට දත්ත රැස්කර ගැනින.

**පර්යේෂණ ක්ෂේත්‍රය**

2000 වසරේ අප්‍රේල්, මැයි, ජූනි, ජූලි යන මාසවලදී පූර්වෝක්ත දිස්ත්‍රික්ක 15 ඇසුරින් දත්ත රැස්කිරීම කළ අතර (VHS)* වීඩියෝ කැසට්පට, වීඩියෝ සංගත තැටි (VCD)* සංඛ්‍යාංක වීඩියෝ තැටි (DVD)* ගත කළ චිත්‍රපට නැරඹීම හා ස්වසරණය පිළිබඳව අධ්‍යයනය සිදුකරන ලදි.

* VHS - Video Home System
* VCD - Video Compact Disc
* DVD - Digital Compact Disc

**පර්යේෂණ ගැටළු**

1. වීඩියෝ චිත්‍රපට නැරඹීමේ රුචිකත්වයන් කෙබඳු ද?

2. වීඩියෝ චිත්‍රපට සංසරණය සමාජයේ සිදුවන්නේ කවරාකාරවද?

3. වීඩියෝ චිත්‍රපට සමාජයට බලපෑනු ලබන්නේ කෙසේ ද?

4. වීඩියෝ චිත්‍රපට සංසරණය පාලනයකට යටත්කළ යුතු ද?

**පර්යේෂණ අරමුණ**

1. ශ්‍රී ලංකාවේ වීඩියෝ චිත්‍රපට භාවිතය පිළිබඳව විද්‍යාත්මකව කරුණු සොයා බැලීම.

2. වීඩියෝ චිත්‍රපට සංසරණය සමාජයට අහිතකර අන්දමින් සිදුවන්නේ නම් ඒවා පාලනය කිරීම පිණිස අවධානය යොමුකරවීම.

**උපකල්පනය**

1. ශ්‍රී ලංකාවේ වීඩියෝ චිත්‍රපට භාවිතය සමාජ ඵලදායීතාවයට අහිතකර අන්දමින් ක්‍රියාත්මක වේ.

නියදියට අයත් 200 ක සාමාජිකයන්ගෙන් ස්ත්‍රී පුරුෂ නියෝජනය මෙසේය.

| | |
|---|---|
| ස්ත්‍රී | 38% |
| පුරුෂ | 62% |
| | 100% |

සියලුම සාමාජිකයන්ගේ අධ්‍යාපන තත්ත්වයන් පහත සඳහන් පරිදි විය.

| | | |
|---|---|---|
| 1 | පාසල් නොගිය | 1% |
| 2 | පස්වන ශ්‍රේණිය දක්වා පාසල් ගිය | 4% |
| 3 | අටවන ශ්‍රේණිය දක්වා | 7% |
| 4 | අ.පො.ස. සාමාන්‍යපෙළ දක්වා | 21% |
| 5 | අ.පො.ස. සමාන්‍යපෙළ සමත් | 25% |
| 6 | උසස්පෙළ දක්වා | 08% |
| 7 | උසස්පෙළ සමත් | 02% |
| 8 | උපාධිය හදාරන | 15% |
| 9 | උපාධි සමත් | 05% |
| 10 | පශ්චාත් උපාධි හදාරන/ උපාධි සමත් | 01% |
| 12 | එකතුව | 100% |

ප්‍රතිචාර දැක්වූවන්ගෙන් වැඩිම පිරිස අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍යපෙළ

සමත්වූවන්ය. එය 25% කි. සාමාන්‍ය පෙළ විභාගය දක්වා අධ්‍යාපනය ලද්දවුන් දෙවන විශාලතම පිරිස විය. එය 21% කි.

වීඩියෝ චිත්‍රපට නරඹන්නන් කොපමණ කාලයක දැයි විමසූවිට ලැබුණු ප්‍රතිචාරයන් මෙසේය.

| | |
|---|---|
| 1 මාස 1 - මාස 11 | 01% |
| 2 වසර 1 - වසර 4 | 35% |
| 3 වසර 5 - වසර 9 | 27% |
| 4 වසර 10 - වසර 19 | 25% |
| 5 වසර 15 - වසර 19 | 06% |
| 6 වසර 20 - වසර 24 | 03% |
| 7 මතක නැත | 03% |
| එකතුව | 100% |

වැඩිම පිරිසක් වීඩියෝ චිත්‍රපට නැරඹීම ආරම්භකොට ඇත්තේ වසර 1-4 අතර කාල පරිච්ඡේදයේදී ය. එය 35% කි. වසර 5-9 අතර 27% ක් වූ අතර වසර 10-14 අතර 25% කි. මෙයින් පෙනීයන්නේ වසර 14 ක කාලයක සිට මාස 12 ක කාලයක් (වසරක්) දක්වා ශීඝ්‍රව නරඹන්නන්ගේ වර්ධනයක් සිදුවී ඇති බවයි.

මාසයක කාලයක් තුළ වීඩියෝ චිත්‍රපට කොපමණ සංඛ්‍යාවක් නරඹන්නේ ද?

| | | |
|---|---|---|
| 1 | වීඩියෝ චිත්‍රපට 1-4 | 20% |
| 2 | වීඩියෝ චිත්‍රපට 5-9 | 09% |
| 3 | වීඩියෝ චිත්‍රපට 10-14 | 01% |
| 4 | නිශ්චිතව කිව නොහැකිය | 70% |
| | | 100% |

වීඩියෝ චිත්‍රපට නරඹන්නන්ගෙන් ඔවුන් සාමාන්‍යයෙන් මසක කාලයක් තුළ නරඹන චිත්‍රපට සංඛ්‍යාව පිළිබඳව විමසන ලදි. එහිදී 70% ක පමණ ප්‍රමාණයකගේ ප්‍රතිචාරය වූයේ තමන්ට නරඹන සංඛ්‍යාව පිළිබඳව නිශ්චිතව ප්‍රකාශ කළ නොහැකි බවය. 20% ක පමණ ප්‍රතිචාරයක් වූයේ වීඩියෝ චිත්‍රපට 1-4 ක් අතර ප්‍රමාණයක් බොහෝ විට නැරඹීම සිදුකරන බවය.

නැරඹීම සිදුකරන්නේ කොපමණ කාලයක සිට ද?

| | |
|---|---|
| 01 මාස 1-11 | 1% |
| 02 අවුරුදු 1-4 | 35% |
| 03 අවුරුදු 5-9 | 27% |
| 04 අවුරුදු 10-14 | 25% |
| 05 අවුරුදු 15-19 | 06% |
| 06 අවුරුදු 20-24 | 03% |
| 07 කාලය මතක නැත | 03% |
| | 100% |

වීඩියෝ කැසට් පට / තැටි නැරඹීම කොපමණ කලක සිට සිදුකරන්නේ දැයි ඒවා නරඹන්නන්ගෙන් විමසන ලදි. එහිදී 35% ක් කියා සිටියේ වසර 1-4 අතර, සිටි බවය. වසර 5-9 ත් අතර ඇරඹූ පිරිස් 27% කි. වසර 10-14 ත් අතර කාලයක සිට නරඹන්නන් 25% කි. මෙයින් පෙනෙන්නේ පසුගිය වසර 14 ක කාලය තුළ ක්‍රම ක්‍රමයෙන් විශාල පිරිසක් නැරඹීම අරඹා ඇති බවය.

වීඩියෝ කැසට් ධාවන යන්ත්‍රයක් ඔබ සතුව තිබේ ද?

| | | |
|---|---|---|
| 01 | ඇත | 02% |
| 02 | නැත | 88% |
| | | 100% |

වීඩියෝ චිත්‍රපට නරඹන්නන්ගෙන් බහුතරය තමන් සතුව නැරඹීමේ යන්ත්‍රයක් නැත. එය 91% කි. යන්ත්‍ර ඇති සංඛ්‍යාව 9% කි තමා සතුව වීඩියෝ යන්ත්‍රයක් නැතත් වෙනත් ක්‍රමවලට වීඩියෝ නරඹන්නන් විශාල වශයෙන් සිටින බව දැකගන්නට ලැබිණ.

තහනම් වීඩියෝ චිත්‍රපට නැරබීමේ යන්ත්‍රයක් තමන්සතුව නැතිනම් චිත්‍රපට නරඹන්නේ කෙසේදැයි අසනලදී එහිදී දක්වන ලද ප්‍රතිචාර මෙසේය.

| | |
|---|---|
| 01 මිතුරෙකුගේ ( VHS/DVD/VCD) ප්ලේයරයෙන් | 95% |
| 02 ප්‍රදර්ශන ශාලාවකින් | 03% |
| 03 වෙනත් | 02% |
| | 100% |

තමාගේම ධාවන යන්ත්‍ර නැති බොහෝ පිරිසක් නරඹනුයේ මිතුරන්ගේ හෝ මිතුරියන්ගේ තැටි පටි ධාවන යන්ත්‍රයෙනි. එසේ නරඹන සංඛ්‍යාව 95% ක් විය. ප්‍රදර්ශනශාලාවලින් නරඹන සංඛ්‍යාව 3% කි.

වීඩියෝ යන්ත්‍රයක් තිබේනම් මිලදීගත් කාලය

| | |
|---|---|
| 01 මාස-06 වසර-01 | 02% |
| 02 1-4 | 41% |
| 03 5-9 | 30% |
| 04 වසර 10 කට පෙර | 22% |
| 05 කිව නොහැක | 03% |
| 06 වෙනත් | 02% |
| | 100% |

තමා සතුව වීඩියෝ ධාවන යන්ත්‍රයක් තිබේනම් එය මිලදීගත් කාලය පිළිබඳව සඳහන් කිරීමේදී වැඩිම පිරිසක් මිලදීගෙන ඇත්තේ වසර 1-4 අතර කාලයේදීය. එය 41% කි. වසර 5-9 අතර මිලදීගෙන ඇති සංඛ්‍යාව 30 කි. වසර දහයකට පෙර මිලදීගත් සංඛ්‍යාව 22% කි. මෙයින් පෙනීයන්නේ වසර 1 ත් වසර 10 ත් අතර කාලයක් තුළ මිලදී ගැනීමේ වර්ධනයක් සිදුවී ඇති බවය.

චිත්‍රපට නැරඹීමට වඩාත් කැමති මාධ්‍ය

| | |
|---|---|
| 01 (VHS) | 26 |
| 02 (VCD) | 14% |
| 03 (DVD) | 08% |
| 04 සිනමා ශාලා | 35% |
| 05 සියළුම මාධ්‍යයන්ට කැමැතියි | 17% |
| 06 පැහැදිලිව සඳහන් කළ නොහැක | 01% |
| | 100% |

චිත්‍රපට නැරඹීමට වඩාත් කැමති මාධ්‍ය පිළිබඳව කළ විමසුවේදී 35% ක බහුතර පිරිසක් සඳහන් කළේ සිනමා ශාලාවට ගොස් චිත්‍රපටයක් නැරඹීමට තමන් වඩාත් රුචියක් දක්වන බවය. රුචිකත්වයෙන් දෙවන ස්ථානය ගනු ලැබුයේ වීඩියෝ කැසට්පටය. එය 26% ක් විය. මෙම (VHS) මාධ්‍ය ජනප්‍රිය වීම සඳහා වඩාත් හේතුවූයේ (VCD) සහ (DVD) ධාවන යන්ත්‍ර තවමත් ශ්‍රී ලාංකික සමාජයේ වීඩියෝ කැසට් ධාවන යන්ත්‍ර තරම් ව්‍යාප්තව් නොතිබීම ය. එසේම සිනමාශාලාවලට යාමට වඩා වෙනත් ක්‍රමයන්ගෙන් (VHS/VCD/DVD) චිත්‍රපට නැරඹීමට රුචි පිරිස කියා සිටියේ සිනමාශාලාවල පවතින අඩුපාඩු සිනමා ශාලාවලට යාමේ ප්‍රවාහන දුශ්කරතා, වීඩියෝ මාධ්‍යතමන්ට පහසු වෙලාවක පරිශීලන හැකියාව, නව චිත්‍රපටයක් සිනමා ශාලාවක ප්‍රදර්ශනයට පෙර ඉක්මනින් නැරඹීමට ඇති හැකියාව, වාරණයෙන් මිදුණු පිටපත් නැරඹීමේ ඇති හැකියාව සහ මූල්‍යමය තත්ත්වයත්‍ය.

වීඩියෝ චිත්‍රපටවලින් වඩාත් නැරඹීමට කැමති කුමන වර්ගයේ ඒවා ද?

| | |
|---|---|
| 01 සම්භාව්‍ය | 05% |
| 02 ත්‍රාසජනක | 32% |
| 03 ලිංගික | 14% |
| 04 ප්‍රහසන | 02% |
| 05 ප්‍රේම කතා | 11% |
| 06 ලිංගික හා ත්‍රාසජනක | 05% |
| 07 සම්භව්‍ය/ ලිංගික/ ප්‍රේම | 02% |
| 08 සම්භව්‍ය හා ත්‍රාසජනක | 03% |
| 09 ත්‍රාසජනක හා ප්‍රේම වෘත්තාන්ත | 08% |
| 10 ත්‍රාසජනක හා ප්‍රහසන | 05% |
| 11 ලිංගික චිත්‍රපට හැර වෙනත් ඕනෑම චිත්‍රපටයක් | 11% |
| 12 විශේෂත්වයක් නොදක්වමි . | 02% |
| | 100% |

ප්‍රේක්ෂකයන් වීඩියෝ චිත්‍රපටවලින් නැරඹීමට වඩාත් කැමති ත්‍රාසජනක ඒවාටය. එය 32% කි. ලිංගික තේමාවන් සහිත චිත්‍රපට

සඳහා රුචිකත්වය දැක්වූවන්ගේ සංඛ්‍යාව 14% ක් වේ. ප්‍රේම කතාවක් අඩංගු චිත්‍රපට සඳහා රුචිවූවන්ගේ සංඛ්‍යාව 11% ක් විය.

වීඩියෝ චිත්‍රපට ලබාගන්නා ආකාරය

| | |
|---|---|
| 01 කුලියට ලබාගැනීමෙන් | 34% |
| 02 ඉල්ලාගැනීමෙන් | 20% |
| 03 මිලදීගැනීමෙන් | 0.5% |
| 04 වෙනත් (ඉන්ටර්නෙට් ආදියෙන්) | 2.5% |
| 05 කුලියට හා ඉල්ලාගැනීම් | 24% |
| 06 ඉල්ලාගැනීම හා මිළදී ගැනීම සිදුකරමි | 02% |
| 07 කුලියට හා මිළදී ගැනීම සිදුකරමි | 02% |
| 08 සියලුම ආකාරයට භාවිත කරමි | 09% |
| 09 ප්‍රතිචාරයක් නැත | 02% |
| 10 ලබාගන්නා ක්‍රමය කීම ප්‍රතික්ෂේප කරමි | 07% |
| | 100% |

වීඩියෝ චිත්‍රපට වැඩිම ප්‍රමාණයක් ග්‍රාහකයන් ලබාගන්නේ වීඩියෝ ශාලාවලින් කුලියට ය. එය 34% කි. වෙනත් අයගෙන් ඉල්ලා ගෙන නරඹන සංඛ්‍යාව 20% ක් විය. තවත් 24% ක් කුලිය හා ඉල්ලා ගැනීමෙන් නරඹයි.

(VHS/VCD/DVD) චිත්‍රපට නැරඹූ පසු එයම සිනමා ශාලාවකදීත් ප්‍රදර්ශනය වෙද්දී නරඹන්නේ ද?

| | |
|---|---|
| 01 අනිවාර්යයෙන්ම බලයි | 02% |
| 02 ඇතැම්විට බලමි | 74% |
| 03 කිසිසේත්ම නැත | 18% |
| 04 කිවනොහැක | 02% |
| 05 වෙනත් | 04% |
| | 100% |

වීඩියෝ චිත්‍රපට නැරඹීමෙන් පසු එයම සිනමා ශාලාවෙන් නැරඹීම සඳහා යම් උත්තේජනයක් ඇති කරන්නේදැයි සොයාබලන ලදි. එහිදී වැඩිපිරිසක් එනම් 74% ක් සඳහන් කළේ ඇතැම්විට එයම සිනමා ශාලාවකදී නරඹන බවය. 18% ක් කියා සිටියේ කිසිසේත්ම නරඹන්නේ නැති බවය. විශේෂයෙන්ම බහුතර පිරිසවන 74% ක් බොහෝ දෙනෙකු කියාසිටියේ වීඩියෝ කැසටය නිකුත් කළ විගසම චිත්‍රපටයද ප්‍රදර්ශනය කිරීම චිත්‍රපටයේ ප්‍රචාරක කටයුතුවල බපපෑම හා තත්කාලීන සමාජ හා ආර්ථික වාතාවරණය අනුව නැරඹීම තීරණය වන බවය.

මෙහිදී ඇතැම්විට චිත්‍රපටය ගොස් නරඹමි යැයි කියූවත් (74%) ගෙන් බොහෝ පිරිස කියා සිටියේ තවත් සිනමාශාලා එකට ගොස් නැරඹීමට මැලිකමක් දක්වන්නේ පහත සඳහන් අංශ නිසා බවය.

1. තමන්ට සිනමාශාලාවකට චිත්‍රපට නැරඹීමට විශාල දුරක් යාමට සිදුවීම හා එසේගොස් නැරඹීමේදී සොයාගැනීමේ ඇති දුෂ්කරතාව.

2. සිනමාශාලාව කාලීනව දියුණු වී නොමැති වීම. අවම පහසුකම් ග්‍රාමීය ප්‍රදේශවල හා නාගරික ප්‍රදේශවල බොහෝමයකද පැවතීම. උදාහරණයක් ලෙස වැසිකිලි පවා තිබුණත් ඇතැම් ඒවායේ වැසිකිලි නඩත්තු නොකෙරේ. බොහෝ ආසන කැඩීගොසිනි. විදුලිපංකා ආදිය ක්‍රියාත්මක නොවේ. ඇතැම්විට සිතාමතා ක්‍රියාත්මක නොකරයි. එක් අයකු කීවේ තමන් ජූලි මාසයේදී අත්තනගල්ල ආසනයේ සිමාශාලාවක චිත්‍රපට දෙකක් නැරඹූ බවත් එම චිත්‍රපට දෙකම අඛන්ඩව නැරඹීමට නොහැකිවූ බවය. ප්‍රක්ෂේපන යන්ත්‍රයේ ආලෝකය නිසියාකාරව එල්ලනොවීම හා ධාවනය අතරමඟ නතරවීම සිදුවී ඇත. ඒ සෑම අවස්ථාවකදීම චිත්‍රපටයේ කොටස් ඉවත්කොට ඉදිරිපත්කර ඇත.

එසේම තවත් කිහිපදෙනෙක් නිසා සිටියේ තමන්ට චිත්‍රපටය ආරම්භවන තුරු සිනමාශාලාව ඉදිරිපිට කිසිදු ආවරණයක් නැතිව අව්වේ සිටීමට සිදුවන බවත්, සිනමා

ශාලාවල සේවකයන් ප්‍රේක්ෂකයන්ට අයහපත් ආකාරයෙන් සලකන බවත්ය. උදාහරණයක් ලෙස එක් අයකු දැක්වූයේ පසුගිය දිනක තමා කිරිබත්ගොඩ ප්‍රදේශයේ සිනමා ශාලාවකට ගිය බවත් එහිදී තමාගත් ප්‍රවේශපත්‍රය සේවකයන් ලවා අවලංගු කරගැනීම අතපසු වූ බවත් එම අවස්ථාවේ සේවකයන් "ඕයි මෙහෙ එනවා" යි කියමින් අන් ප්‍රේක්ෂකයන් ඉදිරියේ තමන්ට අඩගැසූ බවත්, එයින් තමන් දැඩි අපහසුතාවයට පත්වූබවත් මෙවන් සිදුවීම් නිතර සිදුවන බවත්ය. බොහෝදෙනා සිනමාශාලාවල තත්ත්වය හා ඒවායේ සේවකයන්ගේ ක්‍රියාකලාපයන් දැඩි දෝෂ දර්ශනයට ලක්කළේය. එසේම පවුලේ සැමට නිතර සිනමාශාලාවලට ගොස් චිත්‍රපට නැරඹීමට ප්‍රවේශපත්‍රයක මිල ගණන් වැඩිවීම හරස් වී ඇති බවද ඇතැමුන් විසින් පෙන්වා දෙන ලදි.

පූර්වෝක්තව සඳහන් කරන ලද්දේ බොහෝ දෙනා විසින් තවත් සිනමා ශාලාවට ගොස් චිත්‍රපටයක් නැරඹීමට රිසි වූවත් ඒ සඳහා වූ බාධා වශයෙන් මතුකරන ලද ප්‍රධාන අංශ කිහිපයක් පමණි.

වීඩියෝ චිත්‍රපට නරඹන්නේ කා සමඟද?

| | |
|---|---|
| 01 තනිව | 08% |
| 02 මිතුරන් සමඟ | 37% |
| 03 පවුලේ අය සමඟ | 34% |
| 04 මිතුරන් හා පවුලේ අය සමඟ | 08% |
| 05 තනිව හා මිතුරන් සමඟ | 02% |
| 06 තනිව හා පවුලේ අය සමඟ | 02% |
| 07 ඉහත සියළුම ආකාරයට | 05% |
| 08 නිශ්චිතව කිවනොහැක | 02% |
| | 100% |

වීඩියෝ චිත්‍රපට වැඩිම පිරිසක් නරඹනුයේ තම මිතුරු මිතුරියන් හා සමඟය. එය 37% කි. පවුලේ අය සමඟ නරඹන්නන්ගේ සංඛ්‍යාව 34% ක් විය. තනිව නරඹන්නන්ගේ සංඛ්‍යාව 8% කි.

වෙනත් භාෂාවන්ගෙන් නරඹන්නේ නම් ඔබට එම භාෂාවන් වටහා ගත හැකිද?

| | |
|---|---|
| 01 ඔව් | 11% |
| 02 නැත | 88% |
| 03 ප්‍රතිචාර නැත | 01% |
| | 100% |

මව් භාෂාවෙන් හැර වෙනත් භාෂාවකින් ඉදිරිපත් වන වැඩසටහන් අදාල භාෂාවෙන් තේරුම්ගැනීමට නොහැකි පිරිස ඉතා ඉහළය. එය 88% කි. එසේම භාෂාව වටහාගත හැකියි සඳහන් කළ 11% ක පිරිසෙන් බහුතරය සඳහන් කළේ ඉංග්‍රීසි භාෂාව වැඩසටහන් යම් තරමකින් වටහාගත හැකි බවය. හින්දි හා ද්‍රවිඩ භාෂාව දන්නා පිරිස ඉතාමත් සුළු වශයෙන් විය. වෙනත් භාෂා සඳහා ද එසේමය.

භාෂාව නොතේරේනම් ඔබ එය වටහාගන්නේ කෙසේද?

| | |
|---|---|
| 01 උප ශීර්ෂපාඨ මගින් | 07% |
| 02 රූප මගින් | 89% |
| 03 වෙනත් | 04% |
| | 100% |

මව් භාෂාවෙන් හැර වෙනත් භාෂාවකින් වන වැඩසටහන් නොතේරේ නම් ඒවා වටහාගන්නේ කෙසේදැයි අසන ලදි. එහිදී බහුතර පිරිස වන 89% ක් කියා සිටියේ රූප මගින් වටහාගන්නා බවය. එය රස විඳීමට බාධාවක් නොවන බවය. උපසිරැසි මගින් වටහාගන්නා පිරිස 07% ක් විය. මිතුරන්ගේ අසා දැනගැනීම්, පුවත්පත්වල එන විස්තරයන් ගෙන් දැන ගැනීම් වැනි විවිධ වෙනත් හේතු දැක්වූ පිරිස 4% කි.

නැරඹීමට කැමති කුමන භාෂාවන්ගෙන් යුත් චිත්‍රපටි ද? රුචිකත්වය අනුපිළිවෙලින් සඳහන් කරන්න.

| | සිංහල | හින්දි | ඉංග්‍රීසි | ද්‍රවිඩ | වෙනත් |
|---|---|---|---|---|---|
| පළමු තේරීම | 10% | 07% | 18% | 2.5% | 0.5 |
| දෙවන තේරීම | 06% | 13% | 08% | නැත | 0.5% |
| තෙවන තේරීම | 07% | 10% | නැත | 03% | 02% |
| සිව්වන තේරීම | 01% | නැත | නැත | 06% | 01% |

නියැදි සාමාජිකයන්ගෙන් තමන් නැරඹීමට කැමති කුමන භාෂාවක කැසට්පටදැයි විමසන ලදි. එහිදී තම රුචිකත්වයන් අනුපිළිවෙලින් දක්වන ලෙසද ඔවුන්ට දන්වන ලදි. ඒ අනුව ලැබුණු ප්‍රතිචාර මෙසේය. තමාගේ පළමු රුචිකත්වය ලෙස ඉංග්‍රීසි භාෂාව සඳහන් කළ සංඛ්‍යාව 18% කි. සිංහල භාෂාව බව දැක්වූ පිරිස 10% කි. හින්දි භාෂාව බව දැක්වූ සංඛ්‍යාව 7% කි. ද්‍රවිඩ භාෂාව සඳහා 1.5% ක් විය. වෙනත් භාෂාවන්ගෙන් එන කැසට්පට නැරඹීමට කැමැති අයද වූහ. එය 0.5% වැනි ඉතා සුළු ප්‍රමාණයකි.

වීඩියෝ චිත්‍රපටවල එන ඇතැම් දේ අනුකරණය කරන්නේද?

| | |
|---|---|
| 01 ඔව් | 10% |
| 02 නැත | 79% |
| 03 තරමක් අනුකරණය කරමි | 03% |
| 04 කිසිසේත් නැත | 03% |
| 05 ප්‍රතිචාරයක් නැත | 05% |
| | 100% |

වීඩියෝ චිත්‍රපටයක් නැරඹූපසුව ඒවායේ දර්ශනවල අඩංගු දෑ අනුකරණය කරන්නේදැයි අසන ලද ප්‍රශ්නයට වැඩි පිරිසක් පවසන ලද්දේ තමන් අනුකරණය නොකරන බවය. එය 79% ක් විය. අනුකරණය කරන්නන්ගේ බහුතර ප්‍රතිචාරයන් වූයේ ඇඳුම් මෝස්තර, රූප අලංකරණ අනුකරණය කිරීම කරන බවකි. තවත් ඇතමෙක් කියා සිටියේ නිල් චිත්‍රපටවල පෙන්වන ඉරියව් අත්හදා බලන බවකි. මොවුන්ගෙන් වැඩි පිරිස විවාහකයන්ය.

වීඩියෝ චිත්‍රපටයක් නැරඹීමෙන් පසු සිනමා ශාලාවකින් චිත්‍රපටයක් නැරඹීමට තිබූ අවශ්‍යතාවය නැතිවී ගියේද?

| | |
|---|---|
| 01 ඔව් | 20% |
| 02 නැත | 80% |
| | 100% |

ප්‍රතිචාර දැක්වූවන්ගෙන් වැඩිපිරිසක් එනම් 80% ක් කියා සිටියේ වීඩියෝ චිත්‍රපටයක් නැරඹීමෙන් පසු සිනමාශාලාවකින් චිත්‍රපටයක් නැරඹීමට තිබූ අවශ්‍යතාවන් නැතිවී නොගිය බවය. චිත්‍රපටයක් නැරඹීමේ අවශ්‍යතාව නැති වී ගියේයයි කී පිරිස 20% කි.

ඔබ වීඩියෝ චිත්‍රපටයක් නැරඹූ පසු එය වෙනත් අයෙකුට නැරඹීමට දෙන්නේ ද?

| | |
|---|---|
| 01 ඔව් | 50% |
| 02 නැත | 50% |
| | 100% |

වීඩියෝ චිත්‍රපටයක් නැරඹූ පසුව එය වෙනත් අයෙකුට නැරඹීමට දෙන්නවුන්ගේ ප්‍රමාණය 50% ක් වූ අතර ඉතිරි 50% ක පිරිස කියා සිටියේ තමන් එසේ නොදෙන බවය.

ඔබ කෙදිනක හෝ නිල් චිත්‍රපට හෙවත් අසභ්‍ය චිත්‍රපට නරඹා තිබේද?

| | |
|---|---|
| 01 ඔව් | 57% |
| 02 නැත | 43% |
| | 100% |

නියැදියට අයත් සාමාජිකයන්ගෙන් 57% පමණ සඳහන් කළේ අසභ්‍ය (නිල් චිත්‍රපට)

(Blue Films) නරඹා ඇති බවය. මෙයින් 9% ක් පමණ කාන්තාවන්ය. නිල් චිත්‍රපට නරඹා නැති පිරිස 43% ක් වන අතර මෙයින් බහුතරය කාන්තාවන්ය.

නැරඹුවේ

| | |
|---|---|
| 01 තනිව | 11% |
| 02 මිතුරන් සමඟ | 65% |
| 03 තනිව හා මිතුරන් හෝ මිතුරියන් සමඟ | 19% |
| 04 වෙනත් | 05% |
| | 100% |

අසභ්‍ය චිත්‍රපට නැරඹූ හා නරඹන ආකාරය පිළිබඳ විමසීමේදී පෙනීගියේ 65% ක් පමණ මිතුරන් සමඟ නරඹන්නන් බවය. තනිව හා මිතුරු මිතුරියන් යන දෙඅංශයෙන්ම නරඹා ඇති පිරිස 19% කි. පාසල් සිසුන් හා තරුණ කොටස් මෙසේ මිතුරන් සමඟ නරඹන්නන් අතර ප්‍රමුඛ වේ. පාසල් නිවාඩු කාලයේදී නිල් චිත්‍රපට ඉල්ලුම දිවාකාලයේදී තරමක් ඉහළ යයි. එයට හේතුව පාසල් සිසුන් එම කැසට් ලබාගෙන ප්‍රදර්ශන යන්ත්‍රඇති දෙමාපියන් රැකියාවට යන නිවසකට ගොස් එවා නැරඹීමේ ප්‍රවනතාවයයි.

ඔබ නිල් චිත්‍රපට ලබාගන්නේ

| | |
|---|---|
| 01 මිතුරන්ගෙන් | 42% |
| 02 වීඩියෝ ශාලාවලින් කුලියට | 25% |
| 03 මිළදීගැනීම මගින් | 08% |
| 04 ඉහත අංශ කීපයෙන්ම | 20% |
| 05 වෙනත් | 05% |
| | 100% |

නිල් චිත්‍රපට විශාල වශයෙන් සංසරණය වන්නේ හිතවත්කම් අනුවය. 42% ක පමණ පිරිසක් කියා සිටියේ තමන් කැසට් පටි ලබාගන්නේ මිතුරන්ගෙන් බවය. එම මිතුරන් වීඩියෝ ශාලාවලින් හෝ ඔවුන්ගේ මිතුරන්ගෙන් ඒවා ලබාගන්නා බවය. තමන් වීඩියෝ ශාලාවට නොයන්නේ වීඩියෝ ශාලා හිමියන් හා තමන් අතර විශ්වාසනීයත්වයක් නොමැති නිසා ඒවා දීමට මැලිවීම. ඇපයට හැඳුනුම් පත හෝ කැසට්පටයට මුදලක් තැබිය යුතුවීම සහ තමන්ගේ තත්ත්වයට එය නොගැලපේයයි සිතෙන බැවිනි. සෘජුවම වීඩියෝ ශාලාවලින් ලබාගන්නේ 25% ක පමණ පිරිසකි. ඔවුන් බහුතරයක් වීඩියෝ ශාලා හිමියන් හා ඉතා හොඳ සබඳතාවක් පවත්වාගන යති. වෙනත් ආකාරයේ නිල් චිත්‍රපට නරඹන බව කියූ පිරිසෙන් වැඩි පිරිස අන්තර්ජාලයෙන් ඒවා නරඹන්නන්ය.

ඔබ ජීවිතකාලය තුළ එවන් නිල් චිත්‍රපට කොපමණ සංඛ්‍යාවක් නරඹා තිබේද?

| | ප්‍රතිශතය% |
|---|---|
| 01 1-4 | 11% |
| 02 5-9 | 16% |
| 03 10-14 | 39% |
| 04 15-19 | 06% |
| 05 20-24 | 11% |
| 06 25-29 | 11% |
| 07 කිව නොහැකි ප්‍රමාණය | 06% |
| | 100% |

මේ වන විට නිල් චිත්‍රපට නැරඹූ අයගෙන් එසේ තමන් නරඹා ඇති චිත්‍රපට සංඛ්‍යාව කොපමණදැයි විමසා බලන ලදි. 39% ක පමණ ප්‍රමාණයක් චිත්‍රපට 10-14 අතර ප්‍රමාණයක් නරඹා ඇත. 16% ක් පමණ චිත්‍රපට 5-9 අතර නරඹා ඇත. 11% ක් පමණ චිත්‍රපට 1-4 ත් අතර ප්‍රමාණයකි. 11% ක් පමණ නිල් චිත්‍රපට 20-24 අතර ප්‍රමාණයක් නරඹා ඇත. තවත් 11% පමණ ප්‍රමාණයක් 25-29 අතර ප්‍රමාණයක් නරඹා තිබේ. 6% ක පමණ පිරිසක් සඳහන් කළේ නරඹා ඇති සංඛ්‍යාව පිළිබඳව තමන්ට නිශ්චිතව කිව නොහැකි බවය.

වීඩියෝ ශාලාවල වීඩියෝ කැසට්පට ප්‍රමාණය

| | |
|---|---|
| 01 සිංහල | 01% |
| 02 ඉංග්‍රීසි | 61% |
| 03 ද්‍රවිඩ | 09% |
| 04 හින්දි | 22% |
| 05 නිල් චිත්‍රපට | 08% |
| | 100% |

වීඩියෝ ශාලාවල වැඩිම කැසට්පට සංඛ්‍යාවක් ඇත්තේ ඉංග්‍රීසි භාෂාවෙනි. එය 61% කි. දෙවන ස්ථානය ගෙන ඇත්තේ හින්දි භාෂාවෙන් වන ඒවාය. එය 22% ක් විය. අඩුම කැසට්පට ප්‍රමාණයක් ඇත්තේ සිංහලය. එය 01% කි. ද්‍රවිඩ භාෂක සමාජයක ද්‍රවිඩ භාෂාවෙන් වූ කැසට්පට සංඛ්‍යාව ඉහළමට්ටමක විය. ද්‍රවිඩ භාෂාවෙන් වන කැසට්පට සංඛ්‍යාව 9% ක් වේ. විශේෂයෙන්ම නිල් හෙවත් අසභ්‍ය ලිංගික චිත්‍රපට සංඛ්‍යාව සෑම ප්‍රදේශයකම පාහේ කැපී පෙනෙන්නකි. එය 8% ක් පමණ වේ.

සිංහල චිත්‍රපට ඇති වීඩියෝ ශාලා සංඛ්‍යාව

| | |
|---|---|
| 01 ඇති | 25% |
| 02 නැති | 75% |
| | 100% |

වීඩියෝ ශාලාවල කැසට් එකතුව පිළිබඳව පරීක්ෂාකිරීමේදී පෙනී ගියේ වීඩියෝ ශාලාවලින් 25% ක පමණ, සිංහල වීඩියෝ චිත්‍රපට තිබෙනුයේ. ඉතිරි වීඩියෝ ශාලා 75% කිසිදු සිංහල චිත්‍රපටයක් නොතිබින. සිංහල වීඩියෝ පට ඇති ශාලාවල කැසට් පරීක්ෂා කිරීමේ දී පෙනිගියේ බොහෝ සිංහල කැසට් රූපවාහිනියෙන් විකාශනය කළ ජනප්‍රිය ටෙලිනාටයන් බවය. චිත්‍රපට හා ටෙලිනාට්‍ය මෙසේ කැසට් පට ගතකර ඇත්තේ රූපවාහිනියෙන් විකාශනය කරද්දී නීතිවිරෝධී ආකාරයෙනි. මෙහි හාස්‍ය ජනක තත්ත්වය නම් චිත්‍රපට ප්‍රදර්ශනයේදී එය පිටපත් කිරීම කුලියට බද්දට දීම හෝ මහජන ප්‍රදර්ශනය තහනම් යයි කරන අවවාදාත්මක උපශීර්ෂපාඨයන් පවා තිබියදී ඒවා පිටපත් කිරීම හා කුලියට බද්දට දීම හා විකිණීම ය.

වීඩියෝශාලා හා පොලීසිය අතර පවත්නා සබඳතාව

| | |
|---|---|
| 01 පොලීසිය සමඟ සබඳතා පවතී | 43% |
| 02 පොලීසිය සමඟ සබඳතා නැති | 57% |
| | 100% |

වීඩියෝ ශාලාවල නීතිවිරෝධී අසභ්‍ය ලිංගික චිත්‍රපට (Blue Films) ලඟ තබාගැනීම හා ඒවා බෙදාහැරීම පොලිසියේ අත්අඩංගුවට පත්නොවී සිදුකරන්නේ කෙසේදැයි වීඩියෝ ශාලා හිමියන්ගෙන් අසන ලදි. එහිදී ශාලාහිමියන් 57% පමණ කියා සිටියේ පොලිසිය හා තමන් අතර කිසිදු සබඳතාවයක් නොමැති බවත් ඒවා ඉතාරහසේ සුරක්ෂිතව බෙදාහරින බවය. මෙහිදී ඔවුන් යොදාගන්නා උපක්‍රම කිහිපයක්ද පෙන්වාදෙන ලදි. ඉන් එක් ක්‍රමයක් නම් කැසට් පටයේ මුලට අසභ්‍ය නොවන ජනප්‍රිය චිත්‍රපටයක කොටසක් පටිගත කිරීමය. එය විනාඩි පහක කාලයක් ආසන්න වශයෙන් විකාශනය විය හැක. පොලිසිය පැමිණ කැසට්පට පරීක්ෂා කළත් ඔවුන් ඒවා ධාවනය කරන්නේ මුල කොටසින් විනාඩි පහකට අඩු කාලයක් පමණි. එවන් අවස්ථාවක පොලිසියේ අත්අඩංගුවෙන් මිදීමට මේ නිසා හැකියාවක් තිබේ. දෙවැන්න වීඩියෝ ශාලාවේම රහසිගත ස්ථානයක හෝ අසල ස්ථානයක (කඩයක හෝ නිවසක) සඟවා තැබීමයි. එසේත් නැත්නම් විශ්වාසනීය සාමාජිකයන් අත පමණක් සැඟවූ කැසට්පට දීමය.

ඉතිරි 43% ක පමණ වීඩියෝ ශාලා හිමියන් කියා සිටියේ තමන් සතුව එවන් කැසට් තිබෙන බව පොලිසිය දන්නා බවය. පොලිසිය ඒවා පරීක්ෂා කිරීම නොතකාහැර ඇති බව සඳහන් කරන ඔවුහු ඇතැම් අවස්ථාවලදී පොලිසියේ නිලධාරීන්ද නැරඹීමට කැසට් ගෙනයන බවද පැවසීය. විශේෂයෙන්ම පොලිසිය හා ත්‍රිවිධ හමුදා භටයන් වැඩිහිටියන් අතර වඩාත්ම එවන් කැසට් ගෙනියන්නන් බවද වැඩිදුරටත් ඔවුන් විසින් පවසනු ලදි.

**නිගමන**

1. ශ්‍රී ලංකාවේ වීඩියෝ චිත්‍රපට පිළිබඳව පරීක්ෂා කිරීමේදී පෙනී යන්නේ බොහෝ වීඩියෝ ප්‍රමිතියෙන් තොර ඒවාය. ශ්‍රී ලංකාවට ගෙන්වන චිත්‍රපටයක් ප්‍රසිද්ධ රැඟුම්හලක මණ්ඩලයේ පරීක්ෂාවට ලක්වේ. එහෙත් වීඩියෝ චිත්‍රපට සමාජ ඵලදායිතාවය පිළිබඳව කිසිදු අධිකාරී බලයකින් යුත්

ආයතනයක පරීක්ෂාවට ලක්නොවී සමාජ ගතවේ.

2. එසේම වීඩියෝ චිත්‍රපට පිටපත් කිරීම, විකිණීම, කුලියට බද්දට දීම මහජන ප්‍රදර්ශනය කිරීම වීඩියෝ ශාලාවල බහුල ලෙස සිදුකෙරේ. මෙම අනවසර ක්‍රියාවන් නීති සම්පාදනය කිරීම තුළින් පාලනය කළ යුතුය. ඒ සඳහා 1979 අංක 52 දරණ බුද්ධිමය දේපල සංග්‍රහය කාලෝචිත පරිදි සංශෝධනය විය යුතුය.

3. වීඩියෝ ප්‍රදර්ශන ශාලා බොහෝ සේ ව්‍යාප්තව ක්‍රියාත්මක වේ. මේවායේ බොහෝ විට පෙන්වන්නේ අසභ්‍ය චිත්‍රපටය. එම අසභ්‍ය චිත්‍රපට පෙන්වන්නා සේම ඒ අශ්‍රිතවද සමාජ විරෝධී ක්‍රියාවන් ද බොහෝසේ සිදුවන බව සොයාගන්නට ලැබිණ. විශේෂයෙන්ම පාසල් සිසුන් පාසල් වේලාව තුළ හෝ පුද්ගලික උපකාරක පංති පැවැත්වෙන අතරතුර මෙම මෙම ශාලාවලට පැමිණ එම චිත්‍රපට නැරඹීමද දක්නට ඇත. මෙවන් තත්ත්වයන් මත මෙම ප්‍රදර්ශන ශාලා පාලනය කිරීමේ සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතුවේ.

4. වීඩියෝ ශාලා සතුව තිබෙන්නාවූ වීඩියෝ චිත්‍රපට එකතුව පිළිබඳව සොයාබැලීමක් සිදුවිය යුතුය. එසේම ඒවා යම්කිසි පාලනයකට යටත් කළ යුතුවේ. මෙහිදී වීඩියෝ චිත්‍රපට තැටි/පටි නිකුත්කරන ශාලා ලියාපදිංචි කිරීම වෙත්ම ආචාර ධර්ම මාලාවක් හඳුන්වාදීම ද වැදගත්ය.

5. චිත්‍රපට රසවින්දනය වර්ධනය කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් සැලසුම් කළ යුතුය.

6. වගකීමෙන් තොර නීති විරෝධී අයුරින් හැසිරෙන වීඩියෝ ශාලා පරීක්ෂාවත් ඒවා හා සම්බන්ධ පුද්ගලයන් අත් අඩංගුවට ගැනීමට ඔවුන්ට විරුද්ධව නීතිමය පියවර ගැනීමටත් හැකිවන ලෙස අදාල පාර්ශ්වයන්ට කටයුතු කිරීමට දිරිගැන්වීම් සිදුකළ යුතුය.

විශේෂයෙන්ම මා විසින් කළ අධ්‍යයනයේදී පැහැදිලි වූවක් නම් මේ වන විට ශ්‍රී ලාංකිකයන් යොදා රූ ගත කළ අසභ්‍ය දර්ශන ඇතුලත් කැසට්පටද තිබෙන බවයි. මෙම කැසට්පට සඳහා විශාල ඉල්ලුමක් පවතින බවද වීඩියෝ ශාලා හිමියන් පවසන ලදි. මෙවන් තත්ත්වයන් අනාගතයේ ශ්‍රී ලාංකික සමාජයට ඉතා අහිතකර ලෙස බලපානු ඇත.■

## මූලාශ්‍ර


1. ගුණරත්න, අරුණ (1995) **නුර්තියේ සිට රූපවාහිනිය තෙක් සිංහල සිනමාවේ මංසලකුණු** පියසිරි ප්‍රින්ටින් සිස්ටම් නුගේගොඩ පිටු 56-57

2 Statistical abstract of the democratic socialist republic of Sri Lanka (1993) Department of sensus and statistics ministry of policy planing and implementation

3. Asia Week - August 18-25-2000

4. අබේසේකර, තිස්ස (1999) මී ලහ සියවසේ සිනමාව, ඕ සී අයි ඒ ප්‍රකාශනයකි.

5. ශ්‍රී ලංකාවේ චිත්‍රපට කර්මාන්තයේ පුනරුත්තාපනය හා සංවර්ධනය පිළිබඳ ජනාධිපති කමිටු වාර්තාව (සභාපති- සේනක බන්ඩාරනායක) 1997.